# එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක හා සංස්කෘතික සංවිධානයේ අස්පර්ශනීය සංස්කෘතික උරුම සුරක්ෂාව සඳහා වන සම්මුතිය-2003

මෙතැන් සිට යුනෙස්කෝ නමින් හඳුන්වනු ලබන එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක හා සංස්කෘතික සංවිධානය 2003. 09. 29 - 2003. 10. 17 වන දින දක්වා පැරීසියේ දී පැවැත්වූ 32 වැනි මහා සමුළුවේ දී,

අන්තර්ජාතික මානව අයිතිවාසිකම් පිළිබඳ ව පවත්නා නීතිමය ලේඛන වන 1948 මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය, 1966 ආර්ථික, සමාජ සහ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය, 1966 සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය විමර්ශනය කරමින් ද,

සාම්ප්‍රදායික සංස්කෘතිය සහ ජනශ්‍රැති සුරක්ෂාව පිළිබඳ 1989 යුනෙස්කෝ නිර්දේශවල, සංස්කෘතික විවිධත්වය පිළිබඳ 2001 යුනෙස්කෝ විශ්ව ප්‍රකාශනයේ දී සහ 2002 වර්ෂයේ සම්මත කරන ලද සංස්කෘතික අමාත්‍යවරුන්ගේ ඉස්තාන්බුල් ප්‍රකාශනයේ දී අවධාරණය කරන ලද සංස්කෘතික විවිධත්වයේ උල්පත සහ තිරසර සංවර්ධනයේ සහතිකයක් ලෙසින් අස්පර්ශනීය සංස්කෘතික උරුමයේ වැදගත්කම සමාලෝචනය කරමින් ද,

අස්පර්ශනීය සංස්කෘතික උරුමය සහ ස්පර්ශනීය සංස්කෘතික සහ ස්වාභාවික උරුමය අතර පවතින දැඩි අන්තර්-පරායත්තභාවය පිළිබඳ සමාලෝචනය කරමින් ද,

ගෝලීයකරණ හා සමාජ පරිවර්තනීය ක්‍රියාවලිය එක් පසෙකින් ප්‍රජාවන් අතර අලුත් වන සංවාදයක් ඇති කිරීමේ අවස්ථා නිර්මාණය කළත්, අසහනීය සංසිද්ධි නිසා සිදු වෙනවා මෙන් අස්පර්ශනීය සංස්කෘතික උරුමයන්හි පරිහානියට, අභාවයට, විනාශයට හේතු වන

බරපතළ තර්ජන ඒ මඟින් සිදු වන බව සිහිපත් කරමින්, විශේෂයෙන් ම එනිසා එවැනි අස්පර්ශනීය සංස්කෘතික උරුමයන් සුරක්ෂා කර ගැනීමට අවශ්‍ය වන සම්පත් හිඟයක් පවතින බව හඳුනා ගනිමින් ද,

මානව සංහතියේ අස්පර්ශනීය සංස්කෘතික උරුමය සුරක්ෂා කිරීමේ විශ්වීය අධිෂ්ඨානය සහ පොදු සැලකිල්ල පිළිබඳ ව දැනුම්වත් ව සිටිමින් ද,

අස්පර්ශනීය සංස්කෘතික උරුමය නිර්මාණයේ දී, පවත්වා ගැනීමේ දී, සුරක්ෂා කිරීමේ දී සහ ප්‍රතිනිර්මාණය කිරීමේ දී විශේෂයෙන් ආදිවාසී ප්‍රජාවන් ද ඇතුළත් ව ප්‍රජාවන් සහ කණ්ඩායම්, මෙන් ම සමහර අවස්ථාවල දී පුද්ගලයන්, වැදගත් කාර්යභාරයන් ඉටු කරන බවත් එය සංස්කෘතික විවිධත්වය සහ මානව නිර්මාණශීලිත්වය සුපෝෂණය කිරීමේ ලා උපකාරී වන බවත් හඳුනා ගනිමින් ද,

ලෝක සංස්කෘතික සහ ස්වාභාවික උරුමය ආරක්ෂා කිරීමේ 1972 සම්මුතියට විශේෂිත ව සංස්කෘතික උරුමය ආරක්ෂා කිරීම සඳහා ප්‍රාමාණික විධිමත් ලේඛනයක් ස්ථාපනය කරමින්, යුනෙස්කෝවේ පුළුල් ප්‍රතිඵල සහිත ක්‍රියාකාරකම්වල බලපෑම් අවධානයට ලක් කරමින් ද,

අස්පර්ශනීය සංස්කෘතික උරුමය සුරක්ෂණය සඳහා බහු පාර්ශ්වීය ව බැඳී සිටින ලේඛනයක් මේ දක්වා නොමැති බව තවදුරටත් අවධානයට ලක් කරමින් ද,

සංස්කෘතික හා ස්වාභාවික උරුම පිළිබඳ ව දැනට පවත්නා අන්තර්ජාතික එකඟතා, නිර්දේශ හා යෝජනා අස්පර්ශනීය සංස්කෘතික උරුමය සමඟ සබැඳි නව ප්‍රතිපාදන මාර්ගයෙන් ඵලදායී ලෙස සුපෝෂණය කිරීමේ සහ ප්‍රතිපූරණය කිරීමේ අවශ්‍යතාව සැලකිල්ලට ගනිමින් ද,

විශේෂයෙන් තරුණ පරපුර ද ඇතුළත් වන පරිදි, අස්පර්ශනීය සංස්කෘතික උරුමය සහ එය සුරක්ෂා කිරීමේ වැදගත්කම පිළිබඳ පුළුල් දැනුම්වත්භාවය ඇති කළ යුතු බව සැලකිල්ලට ගනිමින් ද,

අන්තර්ජාතික ප්‍රජාව මෙම සම්මුතියේ රාජ්‍ය පාර්ශ්ව සමඟ එක් ව සහයෝගීතාවේ සහ අන්‍යෝන්‍ය උපකාරීත්වයේ ජීව ගුණය මඟින් එබඳු උරුමයන් සුරක්ෂා කිරීමට දායකත්වය දැක්විය යුතු බව සැලකිල්ලට ගනිමින් ද,

විශේෂයෙන් මානව සංහතියේ වාචික සහ අස්පර්ශනීය උරුමය පිළිබඳ විශිෂ්ට කෘති පිළිබඳ ප්‍රකාශනය ද ඇතුළත් ව අස්පර්ශනීය සංස්කෘතික උරුමය හා සබැඳි යුනෙස්කෝ වැඩසටහන් නැවත අවධාරණයට ලක් කරමින් ද,

මිනිසුන් එකිනෙකා සමඟ වඩාත් සමීප වීමට සහ ඔවුන් අතර හුවමාරුව සහ අවබෝධය තහවුරු කිරීමේ සාධකයක් ලෙස අස්පර්ශනීය සංස්කෘතික උරුමයේ අනර්ඝ භූමිකාව සැලකිල්ලට ගනිමින් ද,

මෙම සම්මුතිය 2003 ඔක්තෝබර් මස දාහත් වැනිදා සම්මත කර ගන්නා ලදි.

## I පොදු විධිවිධාන

### 1 වන වගන්තිය - සම්මුතියේ අභිමතාර්ථ

මෙම සම්මුතියේ අභිමතාර්ථ වන්නේ

(අ) අස්පර්ශනීය සංස්කෘතික උරුමය සුරක්ෂා කිරීම;

(ආ) ප්‍රජාවන්, කණ්ඩායම් හා පුද්ගලයන් හට අයත් අස්පර්ශනීය සංස්කෘතික උරුමය කෙරෙහි දක්වනු ලබන ගෞරවය සහතික කිරීම;

(ඇ) අස්පර්ශනීය සංස්කෘතික උරුමයේ වැදගත්කම පිළිබඳ ව ප්‍රාදේශීය, ජාතික සහ අන්තර්ජාතික මට්ටමෙන් දැනුම්වත් භාවය ඉහළ නැංවීම සහ ඒවා අන්‍යෝන්‍ය වශයෙන් අගය කිරීම සහතික කිරීම;

(ඈ) අන්තර්ජාතික සහයෝගීතාව සහ ආධාර ලබා දීම ;

## 2 වැනි වගන්තිය - අර්ථ දැක්වීම

මෙම සම්මුතියේ අභිමතාර්ථ සඳහා,

01) ප්‍රජාවන්, ජන කොටස් සහ සමහර අවස්ථාවල දී පුද්ගලයන් විසින් ස්වකීය සංස්කෘතික උරුමයේ කොටසක් ලෙස පිළිගනු ලබන භාවිතයන්, නියෝජනයන්, අභිනයන්, දැනුම, කුසලතා මෙන් ම උපකරණ, වස්තු, කෞතුක භාණ්ඩ සහ ඒ හා සබැඳි සංස්කෘතික අවකාශ "අස්පර්ශනීය සංස්කෘතික උරුමය" යනුවෙන් අර්ථ දැක්වේ. පරපුරෙන් පරපුරට මෙසේ සම්ප්‍රේෂණය වන අස්පර්ශනීය සංස්කෘතික උරුමය ප්‍රජාවන් සහ ජන කොටස් විසින් ස්වකීය පරිසරයට, සොබාදහම සමඟ අන්තර් ක්‍රියාවට හා ඉතිහාසයට ප්‍රතිචාර දැක්වීමේ දී නිරන්තර ප්‍රතිනිර්මාණයට බඳුන් වෙමින් සංස්කෘතික විවිධත්වය සහ මානව නිර්මාණශීලීත්වය කෙරෙහි වූ ගෞරවාන්විත භාවය ප්‍රවර්ධනය කරමින් ඔවුනට අනන්‍යතාව සහ අඛණ්ඩතාව පිළිබඳ හැඟීමක් ලබා දෙයි. මෙම සම්මුතියේ අභිමතාර්ථ අවධානය යොමු කරනුයේ පවත්නා අන්තර්ජාතික මානව හිමිකම් ලේඛනවලට අනුකූල වූ මෙන් ම ප්‍රජාවන්, ජන කොටස් සහ පුද්ගලයන් අතර අන්‍යෝන්‍ය ගෞරවය සහතික කරන සහ තිරසර සංවර්ධනය සඳහා වන අවශ්‍යතා සපුරන අස්පර්ශනීය සංස්කෘතික උරුම කෙරෙහි පමණි.

02) ඉහත 1 වැනි ඡේදයේ අර්ථ දක්වා ඇති පරිදි "අස්පර්ශනීය සංස්කෘතික උරුමය" අනෙකුත් දේ අතර පහත සඳහන් ක්ෂේත්‍ර තුළ ද ප්‍රකාශ වේ.

(අ) අස්පර්ශනීය සංස්කෘතික උරුමයේ මාධ්‍යයක් වශයෙන් භාෂාව ඇතුළුව මුඛපරම්පරා ගත සම්ප්‍රදාය සහ අභින

(ආ) අභිවාහ්‍ය කලා

(ඇ) සමාජ භාවිත, අභිචාර සහ උත්සව අවස්ථා

(ඈ) ස්වභාවධර්මයට සහ විශ්වයට අදාළ දැනුම සහ භාවිත

(ඉ) පාරම්පරික ශිල්ප කෞශල්‍යය

03) "සුරක්ෂා කිරීම" යනුවෙන් අර්ථ දැක්වෙනුයේ හඳුනා ගැනීම, ප්‍රලේඛනය, පර්යේෂණ, පරි-රක්ෂණය, ආරක්ෂණය, ප්‍රවර්ධනය, වැඩි දියුණු කිරීම සහ විශේෂයෙන් ම විධිමත් හා විධිමුක්ත අධ්‍යාපනය මඟින් සම්ප්‍රේෂණය කිරීම මෙන් ම විවිධ අංශ යළි ප්‍රාණවත් කිරීම මඟින් අස්පර්ශනීය සංස්කෘතික උරුමයේ ශක්‍යතාව තහවුරු කිරීම ඉලක්ක කර ගත් ක්‍රියාමාර්ග වේ.

04) "රාජ්‍ය පාර්ශ්වයන්" යනුවෙන් අර්ථ දැක්වෙනුයේ මෙම සම්මුතියෙන් බැඳුණු හා මෙම සම්මුතිය බලාත්මක ව පවතින රාජ්‍ය ය.

05) භාවිත වන දේශසීමා ගැන සඳහන් 33 වැනි වගන්තියෙහි කොන්දේසිවලට අනුකූල ව මෙහි පාර්ශ්වයන් වන රාජ්‍යවලට මෙම සම්මුතිය අදාළ වේ. එම කොන්දේසි යටතේ "පාර්ශ්වයන්" යන ප්‍රකාශයෙන් එම රාජ්‍ය හැඳින්වේ.

## 3 වැනි වගන්තිය - වෙනත් අන්තර්ජාතික ප්‍රඥප්ති සමඟ පවත්නා සම්බන්ධතාව

මෙම සම්මුතියෙහි සඳහන් කිසිවක් පහත සඳහන් ආකාරයට අර්ථ නිරූපණය කළ නොහැකි ය.

(අ) අස්පර්ශනීය සංස්කෘතික උරුමයේ අංගයක් හා ඍජු ව සම්බන්ධ වන ලෝක සංස්කෘතික සහ ස්වාභාවික උරුමයේ ආරක්ෂාවට අදාළ 1972 සම්මුතිය යටතේ ගැනෙන ලෝක උරුම දේපලවල තත්ත්වය වෙනස් කිරීම හෝ ආරක්ෂාවේ මට්ටම පහත හෙළීම ;

හා

(ආ) බුද්ධිමය දේපළ අයිතිවාසිකම් හෝ ජීව විද්‍යාත්මක හා පාරිසරික සම්පත්වල පරිහරණය සමඟ සබැඳි යම් අන්තර්ජාතික ප්‍රඥප්තියකින් පැවත එන රාජ්‍ය පාර්ශ්වයන් සතු අයිතිවාසිකම්වලට සහ වගකීම්වලට බලපෑමක් කිරීම

## II සම්මුතියට සම්බන්ධ ප්‍රධානාංග

### 4 වැනි වගන්තිය - රාජ්‍ය පාර්ශ්වයන්ගේ මහා සභාව

01) රාජ්‍ය පාර්ශ්වයන්ගේ මහා සභාවක් මෙයින් ස්ථාපනය කරනු ලබන අතර එය මෙහි මින් මතු “මහා සභාව” යනුවෙන් හැඳින්වේ. මහා සභාව මෙම සම්මුතියේ ස්වෛරී ප්‍රධාන අංගය වේ.

02) මහා සභාව සෑම දෙවසරකට ම වරක් එහි සාමාන්‍ය සැසිවාරය සඳහා රැස්විය යුතු වන්නේය. මහා සභාව ස්වකීය තීරණය කිරීම මත හෝ අස්පර්ශනීය සංස්කෘතික උරුමය ආරක්ෂා කිරීම සඳහා වන අන්තර් ආණ්ඩු කමිටුවේ හෝ යටත් පිරිසෙයින් රාජ්‍ය පාර්ශ්වයන්ගෙන් තුනෙන් එකක යන දෙකෙන් එකක ඉල්ලීම මත හෝ අතිවිශේෂ සැසිවාර සඳහා රැස්විය හැකි ය.

03) මහා සභාව විසින් තම කාර්යයන් සඳහා කාර්ය පරිපාටි රීති සම්මත කර ගත යුතු වන්නේය.

### 5 වැනි වගන්තිය - අස්පර්ශනීය සංස්කෘතික උරුමය සුරක්ෂා කිරීම සඳහා වන අන්තර්-ආණ්ඩු කමිටුව

01) අස්පර්ශනීය සංස්කෘතික උරුමය සුරක්ෂා කිරීම සඳහා, මින් මතු “කමිටුව” යනුවෙන් සඳහන් වන අන්තර්-ආණ්ඩු කමිටුවක් යුනෙස්කෝව තුළ ස්ථාපනය කරනු ලැබේ. 34 වැනි වගන්තිය ප්‍රකාර මෙම සම්මුතිය බලාත්මක වූ කල්හි මහා සභා රැස්වීමේ දී රැස්වන රාජ්‍ය පාර්ශ්ව විසින් තෝරා පත් කරගනු ලබන රාජ්‍ය පාර්ශ්ව 18ක නියෝජිතයන්ගෙන් එය සමන්විත යුතු වන්නේය.

02) මෙම සම්මුතියේ රාජ්‍ය පාර්ශ්වයන්ගේ සංඛ්‍යාව 50 වූ කල්හි කමිටුවේ සාමාජික රාජ්‍ය නියෝජිත සංඛ්‍යාව 24 දක්වා වැඩි කළ යුතු වන්නේය.

## 6 වැනි වගන්තිය - කමිටුවේ සාමාජික රාජ්‍ය තෝරා පත්කර ගැනීම හා නිල කාලය

01) කමිටුව සඳහා රාජ්‍ය සාමාජිකයන් තෝරා පත්කර ගැනීම සාධාරණ භූගෝලීය නියෝජනය සහ මාරු වෙමින් කටයුතු කිරීම යන මූලධර්මයන්ට අවනත ව සිදුවිය යුතු වන්නේය.

02) මහා සභාව සඳහා රැස්වන රාජ්‍ය පාර්ශ්ව විසින්, වසර හතරක නිල කාලයක් සඳහා කමිටුවේ සාමාජික රාජ්‍යයන් තෝරා පත් කර ගත යුතු වන්නේය.

03) කෙසේ වුව ද, ප්‍රථම ඡන්ද විමසීමේ දී තෝරා පත් කර ගනු ලබන කමිටුවේ රාජ්‍ය සාමාජිකයන්ගෙන් අඩකගේ නිල කාලය දෙවසරකට සීමා වේ. ප්‍රථම තෝරා පත් කර ගැනීමේ දී මෙම රාජ්‍යයන් කුසපත් ඇදීම මගින් තෝරා ගත යුතු වන්නේය.

04) මහා සභාව, සෑම දෙවසරකට ම වරක්, කමිටුවේ රාජ්‍ය සාමාජිකයන්ගෙන් අඩක් අලුත් කළ යුතු වන්නේය.

05) පුරප්පාඩු පිරවීමට ප්‍රමාණවත් කමිටුවේ රාජ්‍ය සාමාජික සංඛ්‍යාවක් මහා සභාව විසින් තෝරා පත් කර ගත යුතු ය.

06) කමිටුවේ රාජ්‍ය සාමාජිකයකු අනුගාමී නිල කාල දෙකක් සඳහා තෝරා පත් කර ගනු ලැබීය නොහැකි ය.

07) කමිටුවේ රාජ්‍ය සාමාජිකයන් ස්වකීය නියෝජිතයන් වශයෙන් අස්පර්ශනීය සංස්කෘතික උරුමය හා සම්බන්ධ විවිධ ක්ෂේත්‍රයන්හි සුදුසුකම් ලත් පුද්ගලයන් තෝරා ගත යුතු වන්නේය.

## 7 වැනි වගන්තිය - කමිටුවේ කාර්යභාරය

මෙම සම්මුතිය මගින් කමිටුවට ප්‍රදානය කරන ලද පරමාධිකාරයන් කෙරෙහි අගතියෙන් (පූර්ව විනිශ්චයෙන්) තොර ව ඉටු කළ යුතු එහි කාර්යභාරය වන්නේ ;

(අ) සම්මුතියේ අරමුණු ප්‍රවර්ධනය කිරීම සහ ඒවා ක්‍රියාත්මක කිරීමේ ලා දිරිමත් කිරීම සහ අධීක්ෂණය කිරීම;

(ආ) සම්මුතියේ අරමුණු ඉතා ම උසස් ලෙස ඉටු කිරීම සඳහා මාර්ගෝපදේශ ලබා දීම සහ අස්පර්ශනීය සංස්කෘතික උරුමය සුරක්ෂා කිරීම පිණිස වන ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම ;

(ඇ) 25 වැනි වගන්තියට අනුකූල ව, අරමුදලේ සම්පත් පරිහරණය සඳහා සැලසුම් කෙටුම්පත් සකස් කිරීම සහ මහා සභාවේ අනුමතිය සඳහා ඉදිරිපත් කිරීම ;

(ඈ) 25 වැනි වගන්තියට අනුකූල ව, එහි සම්පත් වර්ධනය කර ගැනීමේ ක්‍රම පිළිබඳ සොයා බලමින් ඒවා ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීම ;

(ඉ) මෙම සම්මුතිය ක්‍රියාත්මක කිරීම සඳහා මෙහෙයුම් විධාන සකස් කර මහා සභාවේ අනුමතිය සඳහා ඉදිරිපත් කිරීම ;

(ඊ) රාජ්‍ය පාර්ශ්වයන් විසින් 29 වැනි වගන්තිය ප්‍රකාර ව ඉදිරිපත් කරනු ලබන වාර්තා පරීක්ෂා කර සාරාංශගත කර මහා සභාව වෙත ඉදිරිපත් කිරීම.

(උ) රාජ්‍ය පාර්ශ්වය විසින් ඉදිරිපත් කරනු ලබන පහත සඳහන් ඉල්ලීම් කමිටුව විසින් ස්ථාපනය කරනු ලබන සහ මහාසභාව විසින් අනුමත කරනු ලබන වාස්තවික තෝරා ගැනීමේ නිර්ණායකවලට අනුව පරීක්ෂා කර බලා, එම ඉල්ලීම් පිළිබඳ ව තීරණය කිරීම.

i. 16 හා 17 හා 18 වැනි වගන්තිවල සඳහන් ලැයිස්තුවලට ඇතුළත් කිරීම් සහ යෝජනා;

ii. 22 වැනි වගන්තිය ප්‍රකාර අන්තර්ජාතික සහාය පිරිනැමීම.

## 8 වැනි වගන්තිය - කමිටුවේ ක්‍රියා කිරීමේ පිළිවෙළ

01) කමිටුව මහාසභාවට වගකිව යුතු වන්නේය. එය ස්වකීය සියලු ක්‍රියාකාරකම් සහ තීරණ පිළිබඳ ව මහා සභාවට වාර්තා කළ යුතු ය.

02) කමිටුව ස්වකීය කාර්යපරිපාටි රීති සිය සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් දෙකක බහුතරයක ගෙන් සම්මත කර ගත යුතු ය.

03) කමිටුවට ස්වකීය කාර්යයන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය යැයි සැලකෙන කුමන හෝ ආකාරයේ ආවස්ථික උපදේශනාත්මක ආයතන තාවකාලික පදනම මත පිහිට විය හැකි ය.

04) විශේෂිත කරුණු සම්බන්ධයෙන් කමිටුවට උපදෙස් සැපයීම පිණිස, අස්පර්ශනීය සංස්කෘතික උරුමයට අයත් විවිධ ක්ෂේත්‍රයන්හි පිළිගත් නිපුණතාවක් සහිත රාජ්‍ය හෝ පෞද්ගලික හෝ ආයතනවලට මෙන් ම, පුද්ගලයන්ට ද කමිටුවේ රැස්වීම් සඳහා ආරාධනා කළ හැකිය.

## 9 වැනි වගන්තිය - උපදේශන සංවිධාන ප්‍රතීතනය (සුදුසු යැයි පිළිගැනීම)

01) කමිටුව සඳහා උපදේශන තත්ත්වයෙන් ක්‍රියා කිරීම සඳහා අස්පර්ශනීය සංස්කෘතික උරුම ක්ෂේත්‍රයේ පිළිගත් නිපුණතාවක් සහිත රාජ්‍ය නොවන සංවිධාන ප්‍රතීතනය සඳහා මහා සභාවට යෝජනා කළ යුතු වන්නේය.

02) එවැනි ප්‍රතීතනයක් සඳහා වන නිර්ණායක සහ අනුගමනය කළ යුතු යෝජිත පිළිවෙළ ද කමිටුව විසින් මහාසභාවට යෝජනා කළ යුතු වන්නේය.

## 10 වැනි වගන්තිය - ලේකම් කාර්යාලය

01) යුනෙස්කෝ ලේකම් කාර්යාලයේ සහයෝගය කමිටුවට ලැබිය යුතු වන්නේය.

02) ලේකම් කාර්යාලය මගින් මහා සභාවේ සහ කමිටුවේ ලේඛන පිළිබඳ කටයුතු කිරීම මෙන් ම ඒවායේ රැස්වීම් සඳහා න්‍යාය පත්‍ර කෙටුම්පත් කිරීම සහ තීරණ ක්‍රියාත්මක කිරීම සහතික කළ යුතු වන්නේය.

## III ජාතික මට්ටමින් අස්පර්ශනීය සංස්කෘතික උරුමය සුරක්ෂා කිරීම

### 11 වැනි වගන්තිය - රාජ්‍ය පාර්ශ්වයන්ගේ කාර්යභාරය

එක් එක් රාජ්‍ය පාර්ශ්වය විසින්

(අ) ස්වකීය දේශයේ පවත්නා අස්පර්ශනීය සංස්කෘතික උරුමය සුරක්ෂා කිරීම පිණිස අවශ්‍ය පියවර ගත යුතු ය;

(ආ) 2 වැනි වගන්තියේ 3 වැනි ඡේදයේ සඳහන් සුරක්ෂා ක්‍රියාමාර්ග අතර, ජන කොටස්, කණ්ඩායම් හා අදාළ රාජ්‍ය නොවන සංවිධානවල සහභාගිත්වය සහිත ව ස්වකීය දේශයේ පවත්නා අස්පර්ශනීය සංස්කෘතික උරුමයේ විවිධ අංග හඳුනා ගෙන ඒවා අර්ථ දැක්විය යුතු ය.

### 12 වැනි වගන්තිය - පරිලේඛන

01) ස්වකීය දේශයේ පවත්නා අස්පර්ශනීය සංස්කෘතික උරුමය සුරක්ෂා කිරීමේ අභිප්‍රයෙන් එය හඳුනා ගැනීම තහවුරු කිරීම පිණිස එක් එක් රාජ්‍ය පාර්ශ්වයක් විසින් රාජ්‍යයේ පවත්නා තත්ත්වයට උචිත වන ලෙස, අස්පර්ශනීය සංස්කෘතික උරුම පරිලේඛන එකක් හෝ වැඩි සංඛ්‍යාවක් හෝ සකස් කළ යුතු වන්නේය. මෙම පරිලේඛන කාලානුරූප ව යාවත්කාලීන කළ යුතු වන්නේය.

02) එක් එක් රාජ්‍ය පාර්ශ්වයක් විසින්, 29 වැනි වගන්තිය ප්‍රකාර, ස්වකීය වාර්තාව කමිටුවට ඉදිරිපත් කරන විට, එවැනි පරිලේඛන සම්බන්ධයෙන් අදාළ තොරතුරු ද සැපයිය යුතුය.

## 13 වැනි වගන්තිය - සුරක්ෂා කිරීම සඳහා වන වෙනත් ක්‍රියාමාර්ග

ස්වකීය දේශයෙහි පවත්නා අස්පර්ශනීය සංස්කෘතික උරුමයේ සුරක්ෂාව, සංවර්ධනය සහ ප්‍රවර්ධනය සහතික කිරීම පිණිස එක් එක් රාජ්‍ය පාර්ශ්වයක් විසින්ඃ

(අ) අස්පර්ශනීය සංස්කෘතික උරුමයේ සමාජීය කාර්යභාරය ප්‍රවර්ධනය කිරීම සහ එම උරුමය සුරක්ෂා කිරීම හා සමඟ සැලසුම් වැඩසටහන් ඒකාබද්ධ කිරීම ඉලක්ක කර ගත් පොදු ප්‍රතිපත්තියක් සකස් කර ගැනීම;

(ආ) ස්වකීය දේශය සතු අස්පර්ශනීය සංස්කෘතික උරුමය සුරක්ෂා කිරීම සඳහා හැකියාව සහ සුදුසුකම් සහිත ආයතන එකක් හෝ කිහිපයක් හෝ නම් කිරීම හෝ ස්ථාපනය කිරීම;

(ඇ) අස්පර්ශනීය සංස්කෘතික උරුමය, විශේෂයෙන් ම අභාවයට යාමේ අවදානමක් සහිත අස්පර්ශනීය සංස්කෘතික උරුමය ඵලදායි ලෙස සුරක්ෂා කිරීමේ අභිප්‍රායෙන් යුතු ව විද්‍යාත්මක, තාක්ෂණික හා කලාත්මක අධ්‍යයනයන් මෙන් ම පර්යේෂණ ක්‍රමවේද අභිපෝෂණය කිරීම;

(ඈ) පහත කරුණු ඉලක්ක කොට නිසි නෛතික, තාක්ෂණික, පරිපාලනමය සහ මූල්‍යමය ක්‍රියාමාර්ග යොදා ගැනීම සඳහා ප්‍රයත්න දැරිය යුතු වන්නේය.

(i) අස්පර්ශනීය සංස්කෘතික උරුම කළමනාකරණය පුහුණු කිරීම සඳහා වන ආයතන නිර්මාණය කිරීම සහ ශක්තිමත් කිරීම අභිප්‍රේරණය හා ක්‍රියාවෙන් හෝ වාචික ව හෝ ප්‍රකාශ කිරීම අරමුණු කර ගත් සංසද හා අවකාශ මඟින් එම උරුමය සම්ප්‍රේෂණය කිරීම

(ii) අස්පර්ශනීය සංස්කෘතික උරුමය වෙත ප්‍රවේශ වීම තහවුරු කරන අතර එහි සුවිශේෂ අංශ වෙත ප්‍රවේශ වීම පාලනය කරන්නා වූ චාරිත්‍රානුකූල භාවිතයන් කෙරෙහි ගෞරව දැක්වීම;

(iii) අස්පර්ශනීය සංස්කෘතික උරුමය සඳහා ප්‍රලේඛන ආයතන පිහිටුවා එම තොරතුරු වෙත ප්‍රවේශ වීමේ පහසුකම් සැපයීම.

**14 වැනි වගන්තිය - අධ්‍යාපනය, දැනුම්වත් භාවය ඉහළ නැංවීම සහ ධාරිතා සංවර්ධනය**

(අ) සමාජය තුළ අස්පර්ශනීය සංස්කෘතික උරුමය පිළිගැනීම, එයට ගෞරව දැක්වීම හා එහි වර්ධනය තහවුරු කිරීම පිණිස, විශේෂයෙන් ම;

i. මහජනයා, විශේෂයෙන් ම තරුණ පරපුර, ඉලක්ක කර ගත් අධ්‍යාපනික, දැනුම්වත් භාවය ඉහළ නංවන හා තොරතුරු ලබා දෙන වැඩසටහන්;

ii. අදාළ ජන කොටස් හා කණ්ඩායම් සඳහා ක්‍රියාත්මක කරනු ලබන විශේෂිත අධ්‍යාපනික හා පුහුණු වැඩසටහන්;

iii. අස්පර්ශනීය සංස්කෘතික උරුම සුරක්ෂාව පිණිස ධාරිතා වර්ධන ක්‍රියාකාරකම්, විශේෂයෙන් ම කළමනාකරණ සහ විද්‍යාත්මක පර්යේෂණ; සහ

iv. දැනුම සම්ප්‍රේෂණය කිරීමේ නොවිධිමත් ක්‍රම;

(ආ) එබඳු උරුමයට අන්තරාය වන තර්ජන සහ මෙම සම්මුතියට අනුකූල ව කර ගෙන යනු ලබන ක්‍රියාකාරකම් පිළිබඳ ව ජනතාව දැනුම්වත් ව තැබීමට ප්‍රයත්න දැරීම;

(ඇ) අස්පර්ශනීය සංස්කෘතික උරුමය ප්‍රකාශ කිරීම පිණිස අවැසි ස්වාභාවික අවකාශ සහ ස්මරණ ස්ථාන ආරක්ෂා කිරීම සඳහා ඒ පිළිබඳ දැනුම්වත් භාවය ප්‍රවර්ධනය කිරීම;

මඟින් සැම රාජ්‍ය පාර්ශ්වයක් ම යෝග්‍ය ප්‍රයත්න දැරිය යුතු වන්නේය.

### 15 වැනි වගන්තිය - ජන කොටස්, කණ්ඩායම් සහ පුද්ගල සහභාගිත්වය

අස්පර්ශනීය සංස්කෘතික උරුම සුරක්ෂා කිරීමේ ක්‍රියාකාරකම් රාමුව තුළට, එම උරුමය බිහි කරන්නා වූ, පවත්වා ගෙන යන්නා වූ හා සම්ප්‍රේෂණය කරන්නා වූ ජන කොටස්වල, කණ්ඩායම්වල හා යෝග්‍ය අවස්ථාවල දී, තනි පුද්ගලයන්ගේ සහභාගිත්වය හැකි තාක් උපරිම අයුරින් ලබා ගනිමින් ඔවුන් එහි කළමණාකාරීත්වය පිණිස සක්‍රීය ලෙස නිරත කරවීමට සෑම රාජ්‍ය පාර්ශ්වයක් ම ප්‍රයත්න දැරිය යුතු වන්නේය.

## IV අන්තර්ජාතික මට්ටමෙන් අස්පර්ශනීය සංස්කෘතික උරුමය සුරක්ෂා කිරීම

### 16 වැනි වගන්තිය - මානව සංහතියේ අස්පර්ශනීය සංස්කෘතික උරුම නියෝජන ලැයිස්තුව

01) අස්පර්ශනීය සංස්කෘතික උරුමයේ වඩාත් උසස් දෘශ්‍යතාව සහ එහි වැදගත්කම පිළිබඳ දැනුම්වත් භාවය තහවුරු කිරීම ද සංස්කෘතික විවිධත්වයට ගරු කරන සංවාදවලට අනුබල දීම ද පිණිස අදාළ රාජ්‍ය පාර්ශ්වයන්ගේ යෝජනාව මත කමිටුව විසින් මානව සංහතියේ අස්පර්ශනීය සංස්කෘතික උරුම නියෝජන ලැයිස්තුවක් ස්ථාපනය කර, යාවත්කාලීන කරමින් ප්‍රසිද්ධ කළ යුතු වන්නේය.

02) මෙම නියෝජන ලැයිස්තුව ස්ථාපනය කිරීම, යාවත්කාලීන කිරීම සහ ප්‍රකාශයට පත් කිරීම සඳහා වන නිර්ණායක කමිටුව මඟින් සකස් කර අනුමතිය සඳහා මහා සභාවට ඉදිරිපත් කළ යුතු වන්නේය.

## 17 වැනි වගන්තිය - ඉතා හදිසි සුරක්ෂණ අවශ්‍යතාව සහිත අස්පර්ශනීය සංස්කෘතික උරුම ලැයිස්තුව

01) සුරක්ෂාවට නිසි ක්‍රියාමාර්ග ගැනීමේ අභිප්‍රායන් යුතු ව, කමිටුව විසින් ඉතා හදිසි සුරක්ෂණ අවශ්‍යතාව සහිත අස්පර්ශනීය සංස්කෘතික උරුම ලැයිස්තුවක් ස්ථාපනය කර, යාවත්කාලීන කරමින් ප්‍රසිද්ධ කළ යුතු අතර, අදාළ රාජ්‍ය පර්ශ්වකරුගේ ඉල්ලීම පරිදි එවැනි අස්පර්ශනීය සංස්කෘතික උරුම මෙම ලැයිස්තුවට ඇතුළත් කළ යුතු වන්නේය.

02) ස්ථාපනය කිරීම, යාවත්කාලීන කිරීම සහ ප්‍රකාශයට පත් කිරීම සඳහා වන නිර්ණායක, කමිටුව මඟින් මෙම ලැයිස්තුව සකස් කර අනුමතිය සඳහා මහා සභාවට ඉදිරිපත් කළ යුතු වන්නේය.

03) අතිශය හදිසි අවස්ථාවන්හි දී - කමිටුවේ යෝජනාව මත මහා සභාව විසින් අනුමත කළ යුතු අපේක්ෂිත නිර්ණායක - අදාළ රාජ්‍ය පාර්ශ්වයේ අදහස් විමසා 1 ඡේදයෙහි සඳහන් ලැයිස්තුවට අදාළ උරුම අංගය ඇතුළත් කිරීමට කමිටුවට හැකි ය.

## 18 වැනි වගන්තිය - අස්පර්ශනීය සංස්කෘතික උරුමය සුරක්ෂණය සඳහා වන වැඩසටහන්, ව්‍යාපෘති සහ ක්‍රියාකාරකම්

01) රාජ්‍ය පාර්ශ්වයන් විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා පදනම් කර ගෙන සහ කමිටුව විසින් අර්ථ දැක්වීමට නියමිත වූ ද මහා සභාව විසින් අනුමත කිරීමට නියමිත වූ ද නිර්ණායකවලට අනුකූල ව, සංවර්ධනය වෙමින් පවත්නා රටවල විශේෂ අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් මෙම සම්මුතියේ මූලධර්ම හා අරමුණු විශිෂ්ට ලෙස පිළිබිඹු කරන බවට කමිටුව සලකන අස්පර්ශනීය සංස්කෘතික උරුමය සුරක්ෂණය සඳහා ජාතික, උප-කලාපීය සහ කලාපීය වැඩසටහන්, ව්‍යාපෘති සහ ක්‍රියාකාරකම් කාලානුරූප ව තෝරා ප්‍රවර්ධනය කළ යුතු වන්නේය.

02) මෙය ඉටු කර ගැනීමේ දී, එවැනි යෝජනා සකස් කර ගැනීම සඳහා අන්තර්ජාතික සහයෝගය පතා රාජ්‍ය පාර්ශ්වයන්ගෙන් ලැබෙන ඉල්ලීම් කමිටුව විසින් බාර ගෙන, පරීක්ෂා කර බලා අනුමත කළ යුතු ය.

03) කමිටුව, තමන් විසින් තීරණය කර ගත යුතු වූ ක්‍රම යොදා ගනිමින් විශිෂ්ට පරිචයන් ප්‍රචලිත කිරීම මඟින් එවැනි ව්‍යාපෘති, වැඩසටහන් සහ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම කළ යුතු ය.

## V අන්තර්ජාතික සහයෝගය සහ සහාය

### 19 වැනි වගන්තිය - සහයෝගය

01) මෙම සම්මුතියේ කාර්යයන් සඳහා වන අන්තර්ජාතික සහයෝගයට අන්තර්ගත අනෙකුත් දේ අතර, තොරතුරු හා අත්දැකීම් හුවමාරුව, හවුල් නව වැඩසටහන් ඇතුළත් වන අතර, අස්පර්ශනීය සංස්කෘතික උරුමය සුරක්ෂාව පිණිස රාජ්‍ය පාර්ශ්වයන් විසින් දරනු ලබන ප්‍රයත්නවල දී සහාය වීමේ යාන්ත්‍රණයක් ස්ථාපනය කිරීම ද වේ.

02) සිය ජාතික ව්‍යවස්ථාවන්ට සහ චාරිත්‍රානුකූල නීතියට ද ඒ හා අදාළ භාවිතයන්ට ද අගතියක් නොවන පරිදි, අස්පර්ශනීය සංස්කෘතික උරුම සුරක්ෂණය මානව සංහතියේ පොදු යහපතට හේතු වන බව රාජ්‍ය පාර්ශ්වයන් විසින් හඳුනා ගනු ලැබූ, එය සාක්ෂාත් කරගැනීම සඳහා ද්විපාර්ශ්වික, උප-කලාපීය, කලාපීය සහ අන්තර්ජාතික මට්ටමෙන් සහයෝගයෙන් කටයුතු කළ යුතු වන්නේය.

### 20 වැනි වගන්තිය - අන්තර්ජාතික සහාය පිරිනමනු ලබන කාර්ය

පහත සඳහන් කාර්යයන් සඳහා අන්තර්ජාතික සහාය ලබා දිය හැකි යඃ

(අ) ඉතා හදිසි සුරක්ෂා අවශ්‍යතාව සහිත අස්පර්ශනීය සංස්කෘතික උරුම සුරක්ෂා ලැයිස්තුවේ සඳහන් උරුම සුරක්ෂාව;

(ආ) 11 වැනි සහ 12 වැනි වගන්තිවල කාර්ය සඳහා අස්පර්ශනීය සංස්කෘතික උරුම පරිලේඛන සකස් කිරීම;

(ඇ) අස්පර්ශනීය සංස්කෘතික උරුම සුරක්ෂා ඉලක්ක කර ගනිමින් ජාතික, උපකලාපීය සහ කලාපීය මට්ටම්වලින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන්, ව්‍යාපෘති සහ ක්‍රියාකාරකම් ;

(ඈ) කමිටුව විසින් අවශ්‍ය යැයි සැලකෙන වෙනත් කුමන හෝ කාර්යයක් සඳහා

### 21 වැනි වගන්තිය - අන්තර්ජාතික සහාය පිරිනැමිය හැකි ස්වරූප

කමිටුව විසින් රාජ්‍ය පාර්ශ්වයක් වෙත දෙනු ලබන සහාය පෙර දැක්වූ 7 වැනි වගන්තියේ සඳහන් මෙහෙයුම් නියෝග සහ 24 වැනි වගන්තියේ සඳහන් ගිවිසුම මඟින් පාලනය වන අතර එම සහාය පහත පරිදි දැක්විය හැකි ය.

(අ) සුරක්ෂාව පිළිබඳ විවිධ අංශවලට අදාළ අධ්‍යයන;

(ආ) විශේෂඥයන් සහ වෘත්තියෙහි නියැළෙන්නන් ලබා දීම;

(ඇ) අවශ්‍ය සම්පූර්ණ කාර්ය මණ්ඩලය පුහුණු කිරීම;

(ඈ) ප්‍රමිති හා වෙනත් නිර්ණායක විස්තරාත්මක ව දැක්වීම

(ඉ) යටිතල ව්‍යූහ නිර්මාණය කිරීම හා ඒවා මෙහෙයවීම;

(ඊ) අවශ්‍ය උපකරණ හා දැනුම ලබා දීම;

(උ) නිසි අවස්ථාවේ දී අඩු පොළී ණය සහ ප්‍රදාන ලබා දීම ඇතුළු ව වෙනත් ස්වරූපවල මූල්‍ය හා තාක්ෂණික සහාය ලබාදීම.

**22 වැනි වගන්තිය - අන්තර්ජාතික සහාය පාලනය කරන කොන්දේසි**

01) අන්තර්ජාතික සහාය සඳහා වන ඉල්ලීම් පරීක්ෂා කිරීම පිණිස කමිටුව විසින් කාර්ය පරිපාටියක් ස්ථාපනය කළ යුතු අතර, පිරිවැය පිළිබඳ තක්සේරුවක් මෙන් ම කවර ආකාරයක මැදිහත් වීමක් අපේක්ෂා කරන්නේ ද යන්න හා ඉදිරිපත් කර ඇත්තේ කවර තොරතුරු ද යන්න පිළිබඳ ව විශේෂිත ව සලකා බැලිය යුතු ය.

02) සහාය අපේක්ෂාවෙන් හදිසි අවස්ථාවල දී ලැබෙන ඉල්ලීම් කමිටුව විසින් ප්‍රමුඛතාව ලබාදිය යුතු කරුණක් වශයෙන් පරීක්ෂා කළ යුතු ය.

03) තීරණයකට එළඹීමේ දී අවශ්‍ය වන්නේ යැයි සිතන්නේ නම් කමිටුව විසින් යථෝක්ත අධ්‍යයන සිදු කිරීම හා උපදෙස් ලබා ගැනීම කළ යුතු වන්නේය.

**23 වැනි වගන්තිය - අන්තර්ජාතික සහාය පතා කරනු ලබන ඉල්ලීම්**

01) ස්වකීය දේශයේ පවත්නා අස්පර්ශනීය සංස්කෘතික උරුමය සුරක්ෂාව පිණිස, අන්තර්ජාතික සහාය පතා එක් එක් රාජ්‍ය පාර්ශ්වයකට කමිටුව වෙත ඉල්ලීම් ඉදිරිපත් කළ හැකි ය.

02) රාජ්‍ය පාර්ශ්ව දෙකකට හෝ වැඩි සංඛ්‍යාවකට හෝ එවැනි ඉල්ලීමක් හවුලේ වුව ද ඉදිරිපත් කළ හැකි ය.

03) 22 වැනි වගන්තියේ 1 වැනි ඡේදයෙන් නියමිත තොරතුරු සමඟ අවශ්‍ය ලිපිලේඛන එම ඉල්ලීමට ඇතුළත් කළ යුතු වන්නේය.

### 24 වැනි වගන්තිය - ප්‍රතිලාභී රාජ්‍ය පාර්ශ්වයන්ගේ කාර්යභාරය

01) මෙම සම්මුතියේ විධිවිධානවලට අනුකූල ව, ලබාදෙන්නා වූ අන්තර්ජාතික සහාය ප්‍රතිලාභී රාජ්‍ය පාර්ශ්වයක් සහ කමිටුව අතර ඇති කර ගන්නා වූ ගිවිසුමක් මඟින් විධිමත් ව හසුරුවා ගත යුතු වන්නේය.

02) අන්තර්ජාතික සහාය ලබා ගැනීමේ දී ප්‍රතිලාභී රාජ්‍ය පාර්ශ්වයක් ස්වකීය සම්පත් සීමාව තුළ සුරක්ෂා ක්‍රියාමාර්ග සඳහා වන පිරිවැය හවුලේ බෙදාගැනීම පොදු රීතියක් වන්නේය.

03) අස්පර්ශනීය සංස්කෘතික උරුමය සුරක්ෂා සඳහා ලබා දුන් සහාය භාවිත කිරීමෙන් ලද ප්‍රගතිය පිළිබඳ වාර්තාවක් ප්‍රතිලාභී රාජ්‍ය පාර්ශ්වය විසින් කමිටුව වෙත ඉදිරිපත් කළ යුතු වන්නේය.

## VI අස්පර්ශනීය සංස්කෘතික උරුම අරමුදල

### 25 වැනි වගන්තිය - අරමුදලේ ස්වභාවය සහ මූලාශ්‍රය

01) මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන "අස්පර්ශනීය සංස්කෘතික උරුමය සුරක්ෂා කිරීම සඳහා වන අරමුදලක්" මෙයින් ස්ථාපනය කරනු ලැබේ.

02) මෙම අරමුදල යුනෙස්කෝ ආයතනයේ මූල්‍ය රෙගුලාසිවලට අනුකූල ව ස්ථාපනය කරන ලද භාර අරමුදල්වලින් සමන්විත වන්නේය.

03) අරමුදලේ මූලාශ්‍රය සමන්විත වන්නේ

(අ) රාජ්‍ය පාර්ශ්වයන් විසින් ලබා දෙන දායක මුදල්;

(ආ) යුනෙස්කෝ මහා සමුළුව විසින් මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා වෙන් කරන ලද මුදල්;

(ඇ) (i) වෙනත් රාජ්‍ය;

(ii) එක්සත් ජාතීන්ගේ පද්ධතිය තුළ ක්‍රියාත්මක වන සංවිධාන සහ වැඩසටහන්, විශේෂයෙන් ම එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන, මෙන් ම සෙසු අන්තර්ජාතික සංවිධාන;

(iii) රාජ්‍ය හෝ පෞද්ගලික ආයතන හෝ පුද්ගලයන් හෝ විසින් ලබා දිය හැකි දායක මුදල්, උරුම වශයෙන් ලැබෙන මුදල්, ත්‍යාග.

(ඈ) අරමුදලේ සම්පත් වෙනුවෙන් ලැබිය යුතු යම් පොළියක්;

(ඉ) එකතු කිරීමෙන් ලබා ගත් මුදල් සහ අරමුදලේ සුභසිද්ධිය තකා සංවිධානය කරන ලද කටයුතුවලින් ලද මුදල්;

(ඊ) කමිටුව විසින් පනවනු ලබන අරමුදලේ රෙගුලාසි හා මාර්ගෝපදේශක මඟින් බලය පවරන ලද වෙනත් කුමන හෝ සම්පතක් ; යන මේවායින්

04) මහා සභාව විසින් නියම කරන ලද මාර්ගෝපදේශකත්ව පදනම් කර ගනිමින් කමිටුව විසින් සම්පත් භාවිත කළ යුත්තේය.

05) කමිටුව විසින් අනුමත කරන ලද සාමාන්‍ය සහ විශේෂිත අරමුණු හා සබැඳි විශේෂ ව්‍යාපෘති සඳහා පරිත්‍යාග සහ වෙනත් ආකාරයේ ආධාර පිළිගැනීමට කමිටුව කටයුතු කළ හැකි ය.

06) මෙම සම්මුතියේ අරමුණු සමඟ සංගත නොවන දේශපාලනික, ආර්ථික හෝ වෙනත් ආකාරයේ හෝ කොන්දේසි මෙම අරමුදල වෙත ලබා දෙනු ලබන ආධාර සමග සම්බන්ධ කළ නොහැකි ය.

**26 වැනි වගන්තිය - රාජ්‍ය පාර්ශ්වයන් විසින් අරමුදල වෙත දෙනු ලබන මුදල්**

01) මෙම සම්මුතියේ රාජ්‍ය පාර්ශ්වයන් විසින්, ස්වේච්ඡාවෙන් ගෙවනු ලබන පරිපූරක දායකත්වය පිළිබඳ අගතියකින් තොර ව, සෑම දෙවසරකට වරක් ම අරමුදලට දායක මුදල් ගෙවීමට වගකීමෙන් බැඳෙන අතර එහි ප්‍රමාණය සියලු ම රාජ්‍යයන්ට අදාළ වන පරිදි මහා සභාව විසින් තීරණය කරනු ලබන සමානුගාමී ප්‍රතිශතයක් වන්නේය. මහා සභාවේ මෙම තීරණය ගත යුත්තේ එහි රැස් ව සිටින හා ඡන්දය ප්‍රකාශ කරන, මෙම වගන්තියේ 2 වැනි ඡේදයේ සඳහන් ප්‍රකාශය කර නැති රාජ්‍ය පාර්ශ්වයන්ගෙන් බහුතරය විසිනි. එහෙත්, කිසිඳු අවස්ථාවක දී රාජ්‍ය පාර්ශ්වයන්ගේ දායක මුදල එම රාජ්‍යය විසින් යුනෙස්කෝ ආයතනයේ නිත්‍ය අයවැය වෙත කරනු ලබන ආධාරයෙන් 1%ක් නොඉක්මවිය යුතු ය.

02) කෙසේ වුව ද, මෙම සම්මුතියේ 32 වැනි හා 33 වැනි වගන්තිවල සඳහන් පරිදි එක් එක් රාජ්‍යය, ස්වකීය අපරානුමත කිරීමට, පරිග්‍රහණය කිරීමට, අනුමත කිරීමට හෝ ප්‍රවේශනයට අදාළ ලියකියවිලි තැන්පත් කරන අවස්ථාවේ දී මෙම වගන්තියේ 1 වැනි ඡේදයේ විධිවිධානවලින් තමා නොබැඳී සිටින බවට ප්‍රකාශ කළ හැකි ය.

03) මෙම වගන්තියේ 2 වැනි ඡේදයේ සඳහන් ප්‍රකාශය කළ මෙම සම්මුතියේ රාජ්‍ය පාර්ශ්වයක් වන රාජ්‍යයක්, එකී ප්‍රකාශය ඉල්ලා අස්කර ගැනීමට උත්සාහ දරන්නේ නම් එය කළ යුත්තේ යුනෙස්කෝ අධ්‍යක්ෂ ජනරාල් වෙත දැනුම් දීමෙනි. කෙසේ වුව ද, මෙම ප්‍රකාශය ඉල්ලා අස් කර ගැනීම, ඊළඟ සැසිවාරය සඳහා මහා සභාව ආරම්භ වන දිනය දක්වා එම රාජ්‍යය විසින් ගෙවිය යුතු දායක මුදල සම්බන්ධයෙන් බල නොපැවැත්විය යුතු ය.

04) කමිටුවට ස්වකීය මෙහෙයුම් ඵලදායි ලෙස සැලසුම් කිරීමට හැකි වනු පිණිස, මෙම වගන්තියේ 2 වැනි ඡේදයේ සඳහන් ප්‍රකාශය කළ මෙම සම්මුතියට රාජ්‍ය පාර්ශ්වයන් වන රාජ්‍යයන්ගේ දායක මුදල්, යටත් පිරිසෙයින් දෙවසරකට වරක්, ක්‍රමානුකූල පදනමක්

මත ගෙවිය යුතු අතර එසේ ගෙවනු ලබන දායක මුදල එම රාජ්‍ය පාර්ශ්වය මෙම වගන්තියේ අංක 1 ඡේදයේ ප්‍රතිපාදනවලට අනුව ගෙවීමට බැඳී සිටින මුදලට හැකි තරම් ආසන්න මුදලක් විය යුතු ය.

05) තද්වර්ෂය සඳහා හෝ එයට ආසන්නතම පූර්ව ලිත් වර්ෂය සඳහා හෝ ස්වකීය අනිවාර්ය නොහොත් ස්වේච්ඡා දායක මුදල් ගෙවීම හිඟ තබා ඇති මෙම සම්මුතියේ රාජ්‍ය පාර්ශ්වයන් මෙම කමිටුවේ සාමාජිකයකු වීමට සුදුසුකම් නොලබනු ඇත. මෙම විධිවිධානය ප්‍රථම තෝරා පත් කර ගැනීම සඳහා අදාළ නොවිය යුතු ය. ඒ වන විටත් කමිටුවේ සාමාජිකයකු වන යම් රාජ්‍යයක නිල කාලය මෙම සම්මුතියේ 6 වැනි වගන්තියෙන් විධිවිධාන සලසා ඇති ඡන්ද විමසීමේ වාරයේ දී අවසන් විය යුතු ය.

## 27 වැනි වගන්තිය - අරමුදල වෙත ගෙවනු ලබන ස්වේච්ඡා අතිරේක දායක මුදල්

කමිටුවට මෙහෙයුම් සැලසුම් කිරීම සඳහා 26 වැනි වගන්තිය යටතේ දක්වා ඇති පරිත්‍යාගවලට අතිරේක ව ස්වේච්ඡා පරිත්‍යාග කිරීමට අපේක්ෂා කරන රාජ්‍ය පාර්ශ්වයන් ඒ බව කමිටුවට හැකි ඉක්මනින් දැනුම් දිය යුතු ය.

## 28 වැනි වගන්තිය - අරමුදල් තර කිරීමේ අන්තර්ජාතික ක්‍රියාමාලා

යුනෙස්කෝ අනුග්‍රහය යටතේ අරමුදලේ ශුභසාධනය වෙනුවෙන් සංවිධානය කරනු ලබන අන්තර්ජාතික අරමුදල් තර කිරීමේ ක්‍රියාමාලාවන් වෙත රාජ්‍ය පාර්ශ්වයන් හැකි තරම් දුරට සිය සහයෝගය ලබා දිය යුතුය.

## VII වාර්තා

### 29 වැනි වගන්තිය - රාජ්‍ය පාර්ශ්වයන් විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා

කමිටුව විසින් කාලානුරූපීය ව නිර්වචනය කිරීමට නියමිත ආකෘති නිරීක්ෂණය කරමින් මෙම සම්මුතිය ක්‍රියාත්මක කිරීම සඳහා ගනු ලබන ව්‍යවස්ථාදායක, නියාමක සහ සෙසු ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තා රාජ්‍ය පාර්ශ්වයන් විසින් කමිටුවට භාර දිය යුතු ය.

### 30 වැනි වගන්තිය - කමිටුව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා

01) කමිටුව ස්වකීය ක්‍රියාකාරකම් සහ 29 වැනි වගන්තියේ සඳහන් පරිදි රාජ්‍ය පාර්ශ්වයන් විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා පාදක කොට ගෙන සකස් කළ වාර්තාවක් මහා සභාවේ එක් එක් සැසිවාරය සඳහා ඉදිරිපත් කළ යුතු ය.

02) මෙම වාර්තාව යුනෙස්කෝ මහා සමුළුවේ අවධානයට ලක් කළ යුතුය.

## VIII සංක්‍රාන්තික වගන්තිය

### 31 වැනි වගන්තිය - මානව සංහතියේ වාචික හා අස්පර්ශනීය සංස්කෘතික උරුමයේ අග්‍රකෘති පිළිබඳ ප්‍රකාශනයට දක්වන සබඳතාව

01) මෙම සම්මුතිය බලාත්මක වීමට පෙර මානව සංහතියේ වාචික හා අස්පර්ශනීය සංස්කෘතික උරුමයේ අග්‍රකෘති වශයෙන් ප්‍රකාශිත

අංගයන් කමිටුව විසින් මානව සංහතියේ අස්පර්ශනීය සංස්කෘතික උරුම පිළිබඳ නියෝජන ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය.

02) මානව සංහතියේ අස්පර්ශනීය සංස්කෘතික උරුමය පිළිබඳ නියෝජන ලැයිස්තුවට අංග ඇතුළත් කිරීම, 16 වැනි වගන්තියේ 2 වැනි ඡේදයට අනුකූල ව තීරණය කරනු ලබන අනාගත ලේඛන ගත කිරීම් සඳහා වන නිර්ණායකයක් බවට කිසිදු ආකාරයක පූර්ව නිගමනයක් නොකළ යුතු ය.

03) මෙම සම්මුතිය බලාත්මක වීමෙන් පසු වැඩිමනත් ප්‍රකාශන සිදු කරනු නොලැබේ.

## IX අවසාන වගන්ති

### 32 වැනි වගන්තිය - වලංගු කිරීම, පිළිගැනීම හෝ අනුමත කිරීම

01) ඒ ඒ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කාර්ය පරිපාටිවලට අනුකූල ව යුනෙස්කෝ සාමාජික රාජ්‍ය විසින් මෙම සම්මුතිය වලංගු කිරීම, පිළිගැනීම හෝ අනුමත කිරීම හෝ කළ යුතු වන්නේය.

02) වලංගු කිරීමේ, පිළිගැනීමේ හෝ අනුමත කිරීමේ හෝ නීතිමය ලිපි ලේඛන යුනෙස්කෝ අධ්‍යක්ෂ ජනරාල් හට භාර දිය යුතු වන්නේය.

### 33 වැනි වගන්තිය - ප්‍රවේශනය

01) මෙම සම්මුතිය පිළිගන්නා ලෙසට යුනෙස්කෝ මහා සමුළුවේ ඇරයුම් ලබන යුනෙස්කෝ සාමාජිකයන් නොවන සියලු ම රාජ්‍යයන්ට මෙයට ප්‍රවේශය වීම සඳහා විවෘත කළ යුතු වන්නේය.

02) පූර්ණ අන්තර් ස්වයං පාලනයක් තිබෙන බවට එක්සත් ජාතීන්

විසින් පිළිගත් එහෙත් මහාසභා යෝජනා 1514 (xv) ට අනුකූල ව පූර්ණ ස්වාධීනත්වය ලබා ගෙන නොමැති සහ මෙම සම්මුතියෙන් පාලනය කරනු ලබන කරුණු සම්බන්ධයෙන් සන්ධාන/ගිවිසුම් ආදියට එළඹීමට බලය හිමි එමෙන් ම එවැනි කරුණු සම්බන්ධයෙන් ප්‍රවීණත්වයක් හිමි දේශයන්ට ප්‍රවේශ විය හැකි පරිදි මෙම සම්මුතිය විවෘත කළ යුතු ය.

03) මෙම සම්මුතියට ප්‍රවේශ වීම හා අදාළ ලිපිලේඛන යුනෙස්කෝ අධ්‍යක්ෂ ජනරාල් හට භාරදිය යුතුය.

### 34 වැනි වගන්තිය - බලාත්මක වීම

මෙම සම්මුතිය, එය වලංගු කිරීම, පිළිගැනීම, අනුමත කිරීම හෝ මෙයට ප්‍රවේශ වීම පිළිබඳ තිස්වන ලිඛිතය තැන්පත් කළ දින සිට මාස 3කට අනතුරු ව බලාත්මක වේ. එහෙත් එසේ බලාත්මක වන්නේ එම දින හෝ ඊට පෙර හෝ වලංගු කිරීමට, පිළිගැනීමට, අනුමත කිරීමට හෝ ප්‍රවේශනය වීමට හෝ අදාළ ලිපි ලේඛන තැන්පත් කර ඇති රාජ්‍යයන් සම්බන්ධයෙන් පමණි. වෙනත් යම් රාජ්‍ය පාර්ශ්වයක් සම්බන්ධයෙන් එය බලාත්මක විය යුතු වන්නේ ස්වකීය වලංගු කිරීමේ, පිළිගැනීමේ, අනුමත කිරීමේ හෝ ප්‍රවේශනය වීමේ හෝ නීතිමය ලිපිලේඛන තැන්පත් කර තෙමසකට පසු ව ය.

### 35 වැනි වගන්තිය - සන්ධීය හෝ ඒකීය නොවන ව්‍යවස්ථාදායක ක්‍රම

සන්ධීය හෝ ඒකීය නොවන ව්‍යවස්ථාදායක ක්‍රම සහිත රාජ්‍ය පාර්ශ්වයන්ට පහත සඳහන් විධිවිධාන අදාළ විය යුතුය;

(අ) මෙම සම්මුතියේ විධිවිධාන සම්බන්ධයෙන් වන කල්හි, එකී විධිවිධාන ක්‍රියාත්මක කිරීම සන්ධීය හෝ මධ්‍යම ව්‍යවස්ථාදායක හෝ බලයේ නෛතික බලසීමාව යටතට පැමිණෙන අතර, සන්ධීය හෝ මධ්‍යම රජයේ හෝ බැඳීම සන්ධීය රාජ්‍යයන් නොවන රාජ්‍ය

පාර්ශ්වයන් සඳහා වන බැඳීම හා සමාන විය යුතු වන්නේය;

(ආ) මෙම සම්මුතියේ විධිවිධාන සම්බන්ධයෙන් වන කල්හි එකී විධිවිධාන ක්‍රියාත්මක කිරීම ව්‍යවස්ථාදායක ක්‍රියාමාර්ග ගැනීමට සන්ධීය රාජ්‍ය සමූහයේ ව්‍යවස්ථාදායක ක්‍රමයෙන් බැඳී නොමැති තනි ආණ්ඩුක්‍රම සම්පාදන සහිත රාජ්‍යයන්හි, රටවල, පළාත්වල හෝ රටක ප්‍රදේශවල හෝ අධිකරණ බල සීමාව යටතට පැමිණෙන අතර එම සන්ධීය ආණ්ඩුව එකී විධිවිධාන පිළිගැනීම සඳහා වන ස්වකීය නිර්දේශ සමග එකී විධිවිධාන පිළිබඳ ව එම රාජ්‍යවල, රටවල, පළාත්වල හෝ රටක ප්‍රදේශවල හෝ නිසි බලධාරීන්ට දැනුම් දිය යුතු වන්නේය;

## 36 වැනි වගන්තිය - ගිවිසුමෙන් ඉවත් වීම

01) සෑම රාජ්‍ය පාර්ශ්වයකට ම මෙම සම්මුතියෙන් ඉවත් විය හැකි ය.

02) එම ඉවත් වීම නීත්‍යානුකූල ලේඛනයක් මඟින් දැනුම් දිය යුතු අතර එම ලේඛනය යුනෙස්කෝ අධ්‍යක්ෂ ජනරාල් වෙත භාර දිය යුතු ය.

03) ඉවත් වීමේ නිත්‍යානුකූල ලේඛනය ලැබී මාස 12කින් අනතුරු ව එම ඉවත් වීම ක්‍රියාත්මක විය යුතු ය. එහෙත් එම ඉවත් වීම ක්‍රියාත්මක වන දින දක්වා එසේ ඉවත් වන්නා වූ රාජ්‍ය පාර්ශ්වයේ මූල්‍යමය බැඳීම්වලට කිසිදු ලෙසකින් බලපෑමක් ඇති නොකරයි.

## 37 වැනි වගන්තිය - තැන්පතුලාභියාගේ කාර්යභාරය

33 වැනි හා 33 වැනි වගන්ති මඟින් විධිවිධාන සලසා ඇති තහවුරු කිරීමේ, පිළිගැනීමේ, අනුමත කිරීමේ හෝ ප්‍රවේශ වීමේ නීතිමය ලියවිලි තමන් වෙත භාර දීම සම්බන්ධයෙන් සහ 36 වැනි වගන්තියෙන් විධිවිධාන සලසා ඇති පරිදි ඉවත් වීම පිළිබඳ ව, මෙම සම්මුතියේ තැන්පතුලාභියා වශයෙන් යුනෙස්කෝ අධ්‍යක්ෂ

ජනරාල් විසින් සංවිධානයේ සාමාජික රාජ්‍යයන් වෙත ද 33 වැනි වගන්තියේ සඳහන් සංවිධානයේ සාමාජිකයන් නොවන රාජ්‍යයන් වෙත ද මෙන් ම එක්සත් ජාතීන් වෙත ද දැනුම් දිය යුතු වන්නේය.

### 38 වැනි වගන්තිය - සංශෝධන

01) යම් රාජ්‍ය පාර්ශ්වයකට, අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කරන ලද ලිඛිත නිවේදනයකින් මෙම සම්මුතිය වෙත කළ යුතු සංශෝධන යෝජනා කළ හැකි ය. අධ්‍යක්ෂ ජනරාල් එවැනි නිවේදන සියලු ම රාජ්‍ය පාර්ශ්වයන් අතර බෙදා හැරිය යුතු ය. මෙම නිවේදනය බෙදා හරින ලද දින සිට සයමසක් ඇතුළත රාජ්‍ය පාර්ශ්වයන්ගෙන් අඩකට නොඅඩු පිරිසක් එම ඉල්ලීම වෙත යහපත් ප්‍රතිචාර දැක්වුවහොත්, අධ්‍යක්ෂ ජනරාල් විසින් එම යෝජනාව සාකච්ඡා කරනු ලැබ, හැකි නම් සම්මත කර ගැනීම සඳහා මහා සභාවේ ඊළඟ සැසිවාරයට ඉදිරිපත් කළ යුතු වන්නේය.

02) පැමිණ සිටින රාජ්‍ය පාර්ශ්වයන් ගෙන් තුනෙන් දෙකක බහුතරයකගේ ඡන්දයෙන් යෝජනා සම්මත කර ගත යුතු ය.

03) සම්මත කර ගැනීමෙන් අනතුරු ව, මෙම සම්මුතියට කරන ලද සංශෝධන වලංගු කිරීම, පිළිගැනීම, අනුමත කිරීම හෝ එයට ප්‍රවේශ වීම සඳහා රාජ්‍ය පාර්ශ්වයන් වෙත ඉදිරිපත් කළ යුතු ය.

04) මෙම වගන්තියේ 3 වැනි ඡේදයේ සඳහන් පරිදි නීතිමය ලිපිලේඛන භාර දීමෙන් තෙමසකට පසු රාජ්‍ය පාර්ශ්වයන්ගෙන් තුනෙන් දෙකකගේ මනාපයෙන් සම්මත කර ගත් පසු හුදෙක් සංශෝධන වලංගු කළ, පිළිගත්, අනුමත කළ හෝ ඒවාට ප්‍රවේශ වූ හෝ රාජ්‍ය පාර්ශ්වයන් සම්බන්ධයෙන් පමණක් එම සංශෝධන බලාත්මක වේ. ඉන් අනතුරු ව, එක් එක් රාජ්‍ය පාර්ශ්වයක් විසින් වලංගු කරනු ලබන, පිළිගනු ලබන, හෝ ප්‍රවේශ වන හෝ සංශෝධනයක් සඳහා, එකී රාජ්‍ය පාර්ශ්වය විසින් සිය වලංගු කිරීමේ, පිළිගැනීමේ, අනුමත කිරීමේ හෝ ප්‍රවේශ වීමේ හෝ නීතිමය ලිපිලේඛන භාර දුන් දින සිට තෙමසකට පසු එකී සංශෝධනය බලාත්මක වේ.

05) කමිටුවේ රාජ්‍ය සාමාජික සංඛ්‍යාවට අදාළ 5 වැනි වගන්තියට කරනු ලබන සංශෝධන 3 හා 4 ඡේදවල දක්වා ඇති කාර්ය පරිපාටිය සම්බන්ධයෙන් අදාළ නොවේ. මෙම සංශෝධන ඒවා සම්මත කර ගනු ලබන අවස්ථාවේ දී ම බලාත්මක වේ.

06) මෙම වගන්තියේ 4 වැනි ඡේදයට අනුකූලව සංශෝධන බලාත්මක වීමෙන් අනතුරු ව මෙම සම්මුතියට පාර්ශ්වයක් වන රාජ්‍ය, වෙනස් වූ අභිමතාර්ථයක් ප්‍රකාශ කිරීමට අපොහොසත් වන්නේ නම්;

(අ) එසේ සංශෝධනය කළ සම්මුතියේ පාර්ශ්වයක් වශයෙන්;

සහ

(ආ) සංශෝධනවලින් නොබැඳුණු යම් රාජ්‍ය පාර්ශ්වයක් සම්බන්ධයෙන් එසේ සංශෝධනය නොකළ සම්මුතියට පාර්ශ්වයක් වශයෙන් සලකනු ලැබිය යුතුය.

**39 වැනි වගන්තිය - සාධිකාරි පෙළ**

මෙම සම්මුතිය අරාබි, චීන, ඉංග්‍රීසි, ප්‍රංශ, රුසියන් හා ස්පාඤ්ඤ යන භාෂාවලින් සකස් කර ඇති අතර එම පෙළ සයම සමාන සාධිකාරි වටිනාකමින් යුක්ත වේ.

**40 වැනි වගන්තිය - ලියාපදිංචිය**

එක්සත් ජාතීන්ගේ අධිකාර පත්‍රයේ 102 වැනි වගන්තියට අනුකූල ව මෙම සම්මුතිය යුනෙස්කෝ අධ්‍යක්ෂ ජනරාල්ගේ ඉල්ලීම මත එක්සත් ජාතීන්ගේ මහලේකම් කාර්යාලයේ ලියාපදිංචි කරනු ලැබේ.